**<u>මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ</u>**
**<u>සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ</u>**
**<u>ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>**

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
යොමු අංකය: සීපීසී/එස්පී/01/01/07/02 දිනය: 2014.10.10

1.2 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය :
යොමු අංකය: CPC/HM/HR/11/13 දිනය: 2014.10.14

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය:DMS/D/පොදු/11 - 2 දිනය: 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය
යොමු අංකය: CPC/CS/2/3/SM/H (I) දිනය: 2014.12.08

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය: NPC/10/71/3/SR දිනය: 2015.05.28

02. පත්කිරීම් බලධරයා : මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය : සමාජ සේවා නිලධාරී - අධි පන්තිය
3.2 ශ්‍රේණි : විශේෂ
3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : සමාජ සේවා විෂයයට අදාළව ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හි දී විධායක මට්ටම්වල කාර්ය භාරයට උපයෝගී වන්නා වූ විමර්ශන, තොරතුරු හා දත්ත රැස් කිරීම, විශ්ලේෂණය, සම්පාදනය, වාර්තා සම්පාදනය, සමීක්ෂණ පැවැත්වීම, මධ්‍යම පළාත තුළ කායික මානසික සමාජයීය හා ආර්ථික වශයෙන් අවාසි සහගත තත්ත්වයන්ට පත් වූ පුද්ගලයන්ගේ අවශ්‍යතා සපුරාලීම සහ සපුරා ගැනීමට සහය වීම, ඔවුන්ගේ සුභසාධන කටයුතු ඉටු කර ගැනීමට සහය වීම, අවශ්‍ය සහන සැලසීම හා පුනරුත්ථාපනය හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙවර අනුව සමස්ථ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම යන කාර්යයන්ගෙන් සමන්විත වූ කාර්ය භාරයක් මෙම තනතුර දරන්නන්ට පැවරේ.

3.4 කාර්යයන් පැවරීම : මෙම සේවයේ නිලධාරීන්ට සේවයේ අවශ්‍යතාවය මත මධ්‍යම පළාතේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් ඉහත 3.3 ට අදාළ කාර්යයන් පවරනු ලැබේ.

04. තනතුරුවල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015.09.23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 7 - 2006 A

5.2 වැටුප් පරිමාණය : රු. 20,030 - 11x365 - 18 x500 - 33,045/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ | 06 | 21,885 |

06. සේවා ගණයට අයත් තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරී | විශේෂ | 04 | ඉහත 3.3 හි කාර්යයන් ඉටු කිරීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 04 කි.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම :

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3 පළපුරුද්ද : සමාජ සේවා නිලධාරි තනතුරේ වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ඉන් I වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ උසස්වීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක 05 ක් උපයාගෙන තිබීම.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015.09.23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.4.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

7.4.2.5.1 මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට 7.4.2 මඟින් දක්වා ඇති සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.2.5.2 අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබිය යුතුය.

7.5 වයස

7.5.1 අවම සීමාව : අදාළ නොවේ

7.5.2 උපරිම සීමාව : අදාළ නොවේ

7.6 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයදුම්කරුවන් ලබාගන්නා ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

7.6.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.6.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.6.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

7.6.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබාදීමේ ක්‍රමවේදය ඇමුණුම - 01 හි ඇතුළත් වේ.

7.6.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.7 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : මධ්‍යම පළාතේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර නිවේදනයක් මඟින්.

08. කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ.

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම් : අදාළ නොවේ.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015-09-23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

12. අර්ථ නිරූපණ හා නිර්වචන :

12.1 "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා/තුමිය වේ.

12.2 " ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

12.3 "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්වරයා වේ.

12.4 "කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවයි.

12.5 "සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වේ.

12.6 " සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද එම කාලය තුළදී උපයාගත යුතුව සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

12.7 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙක් සියලුම වැටුප් රහිත කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

13. අන්තර්කාලීන විධිවිධාන :

පහත සඳහන් අන්තර්කාලීන විධිවිධාන මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට එක් වරක් පමණක් අදාළ වන පරිදි ක්‍රියාත්මක වේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2015/09/23 දින අනුමත කරන ලදී. ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාතේ සමාජ සේවා නිලධාරී තනතුරේ වසර 15 ක් සපුරා ඇති හා පූර්වාසන්න වසර 05ක අඛණ්ඩ හා සක්‍රිය I ශ්‍රේණියේ සේවා කාලයක් ඇති, එම වසර 05 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති, I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම නියමිත පරිදි සමත් හෝ කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලද නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙළට ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරනු ලැබේ.

II. මෙම පරිපාටිය ප්‍රකාශයට පත් කිරීමෙන් මාස තුනක් (03) ඇතුළත ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට නිලධාරීන් පත් කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ඇත.

III. කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන අවශ්‍ය ලිපිලේඛන හෝ විස්තර සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

14. ක්‍රියාත්මක වන දිනය
මෙම පරිපාටිය 2013.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ රජය/ මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා රෙගුලාසි අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැනනගින ගැටළුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා විමසා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

| | | |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති ) | ........................ |
| 02. යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | ........................ |
| 03. ජී.ජී.එස්.ඒ. දිසානායක මහත්මිය | (සාමාජික) | ........................ |
| 04. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ........................ |
| 05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | ........................ |

දිනය 2015-08-20

ආණ්ඩුකාර ලේකම්,

2015-08-20 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 15/1037 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2015.09.03

........................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව
ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි/~~නොකරමි~~

........................................
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර

අනුමත කරමි/නොකරමි
........................................
සුරංගනී එල්ලාවල
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20.15/09/23

දිනය 2015.09.23

ඇමුණුම 01

ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨතාවය<br>සමාජ සේවා නිලධාරී I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලය ඉක්මවූ පසු වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 60 | 60 | අදාළ නොවේ |
| 2. කුසලතාවය<br>පූර්වාසන්න වසර 05 සඳහා අදාළ වූ කාර්ය සාධන ඇගයීම් වාර්තා<br>විශිෂ්ඨ බව - එක් වසරකට ලකුණු 3 බැගින්<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - එක් වසරකට ලකුණු 2 බැගින්<br>සතුටුදායක - එක් වසරකට ලකුණු 1 බැගින් | 15 | |
| 3. වෘත්තීය /ක්ෂේත්‍රයට අදාළ වන පාඨමාලා හදාරා තිබීම.<br>1. රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් පශ්චාත් උපාධියක් සඳහා ලකුණු 07 බැගින් (සමාජ විද්‍යාව, සමාජ වැඩ, මනෝ විද්‍යාව, උපදේශනය, අපරාධ විද්‍යාව, සාමය හා ගැටුම් කළමනාකරණය, මානව විද්‍යාව / උපදේශනය විෂයයන්ට අදාළව)<br>2. ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය/ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ලබා ඇති සමාජ වැඩ පිළිබඳ ද්වෛවාර්ෂික ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලකුණු 03 බැගින් (බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකමක් ලෙස සලකනු නොලැබුවා වූ)<br>3. රජයේ පිළිගත් අධ්‍යාපන ආයතනයකින් මනෝ විද්‍යාව/ උපදේශනය පිළිබඳ වසරකට නොඅඩු පාඨමාලාවක් සඳහා ලකුණු 02 බැගින්<br>4. රජයේ පිළිගත් ආයතනයකින් තම ක්ෂේත්‍රයට අදාළව හදාරා ඇති වර්ෂයකට නොඅඩු වෙනත් පාඨමාලාවක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ලකුණු 03යි. | 15 | |
| 4. ක්ෂේත්‍රයට අදාළව ඉටු කර ඇති විශේෂ රාජකාරි, විශේෂ ව්‍යාපෘති හා වෘත්තීය මට්ටමෙන් නිර්මාණශීලීව ක්‍රියාත්මක කළ වැඩසටහන්<br>❖ දිස්ත්‍රික්ක 03 ආවරණය වන පරිදි රාජකාරි ඉටු කිරීම (ලකුණු 02 යි)<br>{ දිස්ත්‍රික්ක 03 හිම රාජකාරි ඉටු කර තිබීම වෙනුවෙන් ලකුණු 02<br>දිස්ත්‍රික්ක 02 ක රාජකාරි ඉටු කර තිබීම වෙනුවෙන් ලකුණු 01<br>එක් දිස්ත්‍රික්කයක පමණක් රාජකාරි ඉටු කර තිබීම වෙනුවෙන් ලකුණු නොලැබේ. }<br>❖ විශේෂ ව්‍යාපෘති, වෘත්තීය මට්ටමෙන් නිර්මාණශීලීව ක්‍රියාත්මක කළ වැඩ සටහන් සහ සම්පත්දායක ආයතන හා පුද්ගල සම්බන්ධීකරණයන් සහ ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට අදාළව කටයුතු කිරීම සඳහා (ලකුණු 03) | 05 | |
| 5. භාෂා ප්‍රවීණතාව<br>පිළිගත් ආයතනයක හදාරන ලද අනෙක් රාජ්‍ය භාෂාවේ සහ සන්ධාන භාෂාවේ<br>ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 02<br>සහතික පත්‍ර පාඨමාලා සඳහා ලකුණු 01<br>කථන හැකියාව සඳහා ලකුණු 02 | 05 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/09/23 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්